කුරුණෑගල ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 29 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 අප්‍රේල් 19 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ). සමාලෝචිත වර්ෂයට අදාල පොලී ආදායම් යටතේ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ රු.610,462 ක් වටිනා ස්ථාවර තැන්පතුව වෙනුවෙන් වූ පොලිය රු.21,366 ක් ද මහජන බැංකුවේ රු.2,000,000 ක් වටිනා ස්ථාවර තැන්පතුව වෙනුවෙන් වූ පොලිය රු.66,666 ක් ද වශයෙන් රු.88,032 ක් පොලී ආදායම වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ). ගිණුම් විෂයයන් 2 කට අදාලව ස්ථාවර වත්කම් ලේඛන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට කලවැඩ වටිනාකම රු.2,118,142 ක් වුවත් එය ශේෂ පත්‍රයේ ස්ථාවර වත්කම් යටතේ රු.2,845,000ක් ලෙස රු.726,858 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂයට අදාල පොලී ආදායම් යටතේ මහජන බැංකුවේ රු.1,500,000 ක් වටිනා ස්ථාවර තැන්පතුව වෙනුවෙන් වූ පොලිය රු.20,625 ක් අඩුවෙන් පොලී ආදායම යටතේ ගිණුම් ගතකර තිබුණි.

(ඈ). මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛණ අනුව කර්මාන්ත ණයහිමි ශේෂය රු.53,139,228 ක් වුවද, එය රු.47,742,024 ක් ලෙස ගිණුම් ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණය හිමියෝ රු.5,397,204 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඉ). ගිණුම සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛණ අනුව ලීබඩු සවිකිරීම් වල වටිනාකම රු.2,900,354 ක් වුවද, එය ශේෂ පත්‍රයේ රු.2,839,379 ක් ලෙසට ගිණුම් ගතකිරීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලීබඩු සවිකිරීම් වල වටිනාකම රු.60,975 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඊ). සමාලෝචිත වර්ෂයට අදාලව වැඩසටහන් 05 ක් වෙනුවෙන් ලැබී තිබූ වැටුප් ප්‍රතිපූර්ණ මුදල වූ රු.23,781,913 ක ප්‍රමාණය පළමු වැඩසටහන යටතේ පමණක් ගිණුම් ගතකර තිබුණි.

(උ). සමාලෝචිත වර්ෂය තුළදී අයකරගන්නා ලද එකතුකළ අගය මත බදු, මුද්දර ගාස්තු හා ජාතිය ගොඩනැගීමේ බදු මුදල් ඒ ඒ ගිණුම් වලට බැර කර තිබියදී, ආපසු එම මුදල් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කිරීමේදී එම එකිනෙක ගිණුම් හර නොකර එකතු වටිනාකම රු.1,239,227 ක් විවිධ තැන්පත් ගිණුම හරකර තිබුණි. එනිසා අදාල බදු ගිණුම් වල සමාලෝචිත වර්ෂය අවසානයට එකතු වටිනාකම රු.1,239,227 ක සාවද්‍ය ශේෂයක් පැන නැගී තිබුණි.

(ඌ). සමාලෝචිත වර්ෂය තුල රු.2,000,000 ක් වටිනා ස්ථාවර තැන්පත් ගිණුමක් ආරම්භ කර තිබූ අතර, එය ස්ථාවර තැන්පත් ගිණුමට හර කර විවිධ තැන්පත් ගිණුමට බැරකර තිබීම හේතුවෙන් විවිධ තැන්පත් ගිණුමේ ශේෂය රු.2,000,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(එ). 2009 වර්ෂය අවසානයේදී ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ රු.696,915 ක් වැඩිපුර ගිණුම් ගත කිරීම සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමේදී සමුච්චිත අරමුදල හරකර වැටුප් ප්‍රතිපූර්ණ ගිණුම බැර කළයුතු වුවද, ජනල් සටහන් අංක 30 මගින් හිඟ හිටි වැටුප් ප්‍රතිපූර්ණ ගිණුම හරකර සමුච්චිත අරමුදල බැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට එක ගිණුම් වල ශේෂ රු.696,915 බැගින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ). 2009 වර්ෂයට අදාලව අඩුවෙන් ගිණුම් ගතකර තිබූ රු.1,715,560 ක වැටුප් ප්‍රතිපූරණ සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමේදී වැටුප් ප්‍රතිපූර්ණ ගිණුම හරකර සමුච්චිත අරමුදල බැර කළයුතු වුවද, ජනල් සටහන් අංක 34 මගින් සමුච්චිත අරමුදල හර කර වැටුප් ප්‍රතිපූර්ණ (වත්කම්) ගිණුම බැර කිරීම හා ජනල් සටහන් අංක 37 මගින් වැටුප් ප්‍රතිපූර්ණ (වත්කම්) ගිණුම හර කර පුනරාවර්ථන ආධාර ගිණුම බැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාලව පුනරාවර්තන ආධාර රු.1,715,560 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ). 2009 වර්ෂයට අදාලව 2010 වර්ෂයේ ලැබී තිබූ රු.4,005,191 ක් වූ වැටුප් ප්‍රතිපූර්ණ මුදල ජනල් සටහන් අංක 38 මගින් හිඟ හිටි වැටුප් ප්‍රතිපූර්ණ ගිණුම හර කර පුනරාවර්ථන ආධාර ගිණුම බැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාලව පුනරාවර්ථන ආධාර රු.4,005,191 කින් වැඩියෙන් ගණුම් ගතකර තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 19 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.139,292,387 ක් වූ අතර, උපයෝගී ලේඛන / වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.138,930,641 ක් විය.

1.3.3 <u>පැහැදිලි නොකළ වෙනස්කම්</u>

ගිණුම් විෂයයන් 10 කට අදාලව පැහැදිලි නොකල රු.6,016,164 ක ශේෂයක් පැවතුණි.

1.3.4 <u>ගෙවිය යුතු ගිණුම්</u>

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.3,966,165 ක් විය.

1.3.5 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

<u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.35,924,663 ක් වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.13,427,594 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.1,419,560 ක් විය.

2.2 <u>මූල්‍ය පාලනය</u>

(අ). ගිණුම් විෂයයන් 5 කට අදාලව වර්ෂ තුනකට වඩා වැඩි කාලයක් තිස්සේ පවතින රු.3,124,440 ක් වූ ණයහිමි ශේෂ සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කර නොතිබුණි.

(ආ). දීර්ඝ කාලයක් තිස්සේ දිගින් දිගටම පැවත එන ගිණුම් විෂයයන් 07 කට අදාලව පැවති රු.2,129,960 ක ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පියවා නොතිබුණි.

(ඇ). සභාවේ බැංකු ගිණුමකට අදාලව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් වන විටද 2009 වර්ෂයේ සිට පැවත එන එකතු වටිනාකම රු.1,150 ක් වන මාරු නොවූ මුදල් ඇණවුම් දෙකක්ද 2005 වර්ෂයේ සිට පැවත එන බැංකුව විසින් අයකල රු.6,876 ක හර බද්දක් ද 2003 වර්ෂයේ ප්‍රදර්ශන දැන්වීම් පුවරුවක් සඳහා අයකරන ලද රු.36,000 ක ගාස්තුවක් ද ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබූ අතර රු.38,775 ක් වටිනා චෙක්පත් 04 ක් අගරු චෙක්පත් යටතේ පැවති අතර, ඒ සම්බන්ධයෙන් අදාල කාල වකවානු වල කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට අයකර ගැනීමට අපහසු වී තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 1,727 | 1,782 | 2,185 | 1,722 | 1,776 | 256 |
| (ii) | බදුකුලී | 1,858 | 1,984 | 212 | 2,034 | 2,231 | 48 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,373 | 2,688 | 798 | 2,333 | 2,747 | 938 |
| (iv) | වෙනත් ආදායම් | 61,069 | 60,337 | 3,952 | 16,785 | 51,134 | 3,949 |
| | එකතුව | 67,027 | 66,791 | 7,147 | 22,874 | 57,888 | 5,191 |

### 2.3.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර ගත් රු.4,088,176 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

### 2.3.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.7,328,238 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

### 2.3.4 ව්‍යාපාර බදු

ව්‍යාපාර බදු යටතේ 2009 වර්ෂයට අදාලව අවස්ථා 02 ක් යටතේ රු.12,000 ක හිඟ ශේෂයක් පැවති අතර, "මෙම හිඟ මුදලේ රු.6,000 ක හිඟයකට අදාල බදුකරු මේ වන විට ප්‍රදේශය හැරගොස් ඇති බැවින් අදාල හිඟ මුදල අයකර ගැනීමට නොහැකි වී ඇති බව" 2010 දෙසැම්බර් 06 දින සභාපතිවරයා මා වෙත දන්වා තිබුණි.

2.3.5 වරිපනම් බදු

සභාවේ සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බදු බිල් කිරීම රු.1,727,447 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.2,029,614 ක් ලෙස වාර්ෂික බිල් කිරීම් වලට ආසන්න අගයක්ව පැවතුණි. එයින් ද වැල්ලව උපකාර්යාලයේ හිඟය රු.1,373,262 ක් විය. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්ති හා 1988 ප්‍රාදේශීය සභා රීති මාලාවේ 33 සිට 41 රීති ප්‍රකාරව කටයුතු කර හිඟ අයකර ගැනීම සඳහා සැලකිලිමත් වී නොතිබුණි.

2.3.6 ඉඩම් වෙන්දේසි බදු

2007 වර්ෂයේදී ඉඩම් කට්ටි සැලැස්ම අනුමත කරන ලද කවුඩාවත්ත මෙනේරිහේන නැමැති ඉඩමේ වෙන්දේසිකරුගේ තක්සේරුව අනුව අයකල හැකි 1% බදු මුදල රු.48,600 ක් වුවත්, සභාවේ ආදායම් පරිපාලක ගේ තක්සේරුව අනුව එකී ඉඩම මත තක්සේරු වටිනාකම මත 1% ක බදු මුදල රු.40,030 ක් ලෙස දක්වා තිබීමෙන් සභාව රු.8,570 ක බදු මුදලක් අඩුවෙන් අයකර තිබුණි.

2.4 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 27,681 | 26,318 | 1,363 | 25,364 | 25,271 | 93 |
| අනෙකුත් | 27,009 | 26,972 | 37 | 25,490 | 31,198 | (5,708) |
| උප එකතුව | 54,690 | 53,290 | 1,400 | 50,854 | 56,469 | (5,615) |
| ප්‍රාග්ධන වියදම | 92,690 | 92,690 | - | 82,454 | 66,255 | 16,199 |
| මුළු එකතුව | 147,380 | 145,980 | 1,400 | 133,308 | 122,724 | 10,584 |

2.5 අධිභාර

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(3) වගන්තියේ විධිවිධාන යටතේ වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් පනවන ලද අධිභාර අනුව 2010 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණ අධිභාර අගය රු.95,000 ක් විය.

## 2.6 මානව සම්පත් කළමණාකරණය

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| විධායක | 01 | 01 |
| ද්විතියික | 24 | 21 |
| ප්‍රාථමික | 67 | 63 |
| වෙනත් (අනියම්, තාවකාලික) | 22 | 22 |

## 2.7 වත්කම් කළමනාකරණය

### 2.7.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.78,995,728 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.398,346 ක් විය.

### 2.7.2 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවීම හිඟ හිට තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.77,047 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව ද රු.77,047 ක් විය.

### 2.7.3 අචල ජංගම වත්කම්

සමාලෝචිත වර්ෂය අවසානයට වසර 03 කට වැඩි කාලයක සිට පැවත එන රු.230,000 ක් වටිනා අක්‍රීය ගිණුම් ශේෂ 02 ක් පැවතුණි.

## 2.8 ආර්ථික නොවූ ගණුදෙනු

(අ). 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනත හා එම පනත යටතේ පනවන ලද නියෝග හා රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකිරීම මත 2010 ජනවාරි මස දායක මුදල් ප්‍රමාදවී ගෙවීම නිසා රු.1,210 ක අධිභාර මුදලක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට ගෙවා තිබුණි.

(ආ). විදේශයක පැවැත්වීමට නියමිතව තිබූ විශ්ෂ පුහුණු වැඩමුළුවට සභාවේ නිලධාරීන් තිදෙනෙකු සහභාගි කරවීම සඳහා රු.390,000 ක් 2010 සැප්තැම්බර් 27 දින පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය වෙත ගෙවා තිබුණද අදාල පාඨමාලාව අවලංගු වී ඇති අතර එකී මුදල් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ආපසු ලබාගෙන නොතිබුණි.

2.9 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

පිඹුරුවැල්ල හැලව මාර්ගය පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත් කරගැනීම

පිඹුරුවැල්ල හැලව මාර්ගය පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට 2004 වර්ෂයේදී රු.196,200 ක් මාස්පොත ප්‍රදේශීය ලේකම් වෙත තැන්පත් කර තිබුණද ඉඩම් හිමියෙකුගේ ඉදිකිරීමක් මත, 2008 අප්‍රේල් 01 දිනැති ප්‍රධාන ලේකම් අමතන ලද ලිපියෙන් අදාල අත්පත් කර ගැනීම අවලංගු කර 2009 අප්‍රේල් 08 දිනැති තක්සේරුව අනුව රු.310,000 කට නැවත තක්සේරු කර තිබුණි. අදාල හිඟ මුදල වූ රු.113,800 ද මාස්පොත ප්‍රාදේශීය ලේකම් වෙත තැනැපත් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඉඩම පවරා ගෙන මාර්ගය පුළුල් කිරීමක් සිදුව නොතිබුණි. ප්‍රාදේශීය සභාවේ කරුණු පැහැදිලි කිරීම් අනුව අනෙකුත් ආයතන වල කාල ප්‍රමාදය මෙයට හේතු වී ඇති බව සභාපතිවරයා 2010 දෙසැම්බර් 06 දින මා වෙත වාර්තා කර තිබුණි.

2.10 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ). සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයින්ට අදාලව සභාව විසින් එකී අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු.5,068,344 ක් ව තිබුණි. එමෙන්ම සභාවට අදාල මාසික වාරිකය ලෙස රු.15,419 බැගින් එකී අරමුදල විසින් අයකර පැවතියද, එකී අයකිරීම් සභාවේ කුමන සේවකයන්ට අදාලවද යන්න සභාව දැනුවත් වී නොතිබුණි.

(ආ). 2004 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව රු.23,000 ක් වටිනා ගේජ් 19 යකඩ පුටු 100 ක හා රු.83,000 ක් වූ ප්ලාස්ටික් පුටු 200 ක ඌණතාවයන් අනාවරණය වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඒවායේ වටිනාකම දෙපාර්තමේන්තු ගාස්තු සමඟ වගකිව යුතු අයගෙන් අයකිරීමට කටයුතු කර නොතිබුණි.

2.11 කාර්ය සාධනය

2010 වර්ෂයේ අයවැය ලේඛනය මගින් රු.2,400,000 ක ප්‍රතිපාදන මත ඉටුකිරීමට සැලසුම් කර තිබූ සුභ සාධන ව්‍යාපෘතීන් 08 ඉටුකර නොතිබුණි.

## 2.12 කොන්ත්‍රාත් පරිපාලනය

2008 වර්ෂයේ පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ රු.1,000,000 ක ප්‍රතිපාදනයක් කසල බඳුන් නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා සභාවට ලැබී තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට පිරිවැය රු.588,600 ක් වූ කසල බඳුන් 218 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි. අදාල ව්‍යාපෘති කාලය සමාලෝචිත වර්ෂයෙන් අවසන් වී ඇති බැවින් ඉතිරි මුදල වූ රු.411,400 සභාවට ලබාගැනීමට නොහැකි වී තිබුණි.

## 2.13 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 03. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පාලනය

(ඈ) මූල්‍ය පාලනය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඊ) වත්කම් කළමනාකරණය